**මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය - 2015**

**-----------------------------------------**

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138- සීරි් දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------**

මාර්ග ආංශ සහායක ව්‍යාපෘතියේ සංවර්ධන ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ කාර්යක්ෂම ජාතික මාර්ග පද්ධතියක තිරසාර බෙදාහැරීම මඟින් ප්‍රවාහන පිරිවැය අඩුකිරීමයි. සංවර්ධන ණය ගිවිසුම අංක 4138 සීර් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය එජඩො මිලියන 100 කට හෝ රු.මිලියන 10,125 කට සමාන විගැහි මිලියන 69.10 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යාණය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද, එජඩො මිලියන 98.1 කට හෝ රු.මිලියන 11,579 කට සමාන විගැහි මිලියන 59.60 ක අතිරේක වෙන් කිරීමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2008 ජුනි 23 දින එළඹි අංක 4429 සීර් දරන පළමු අතිරේක සංවර්ධන ණය ගිවිසුම යටතේ සපයා තිබුණි. තවද, 2011 මාර්තු 15 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර අංක 4906 සීර් දරන දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුමට එළඹි අතර එජඩො මිලියන 100 කට හෝ රු.මිලියන 11,081 කට සමාන විහැගි මිලියන 63.6ක අතිරේක වෙන්කිරීමක් ඒ සඳහා කර තිබුණි. ආරම්භකව, ව්‍යාපෘතිය එහි කටයුතු 2006 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර 2011 මාර්තු 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුමේ කරන ලද විධිවිධානයන් ප්‍රකාරව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 අවසන් වර්ෂයට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවධානම් තක්සේරු කිරිම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණන සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මවිසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනකරණය පිළිබද සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත් , වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව

.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය ආදියෙන් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගත හැකි වන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015

දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුනේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යව බව සහ,

(ඒ) සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල්, ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර)කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඊ) සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 244.23 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද යන්ත්‍ර උපකරන හා රු.මිලියන 154.12 නිම කරන ලද සිවිල් වැඩ මාර්ග සංවර්ධන අධිකාරිය, රේඛීය අමාත්‍යාංශය හා මාර්ග නඩත්තු අරමුදල වැනි නියෝජිතායනය වෙත මාරු කර තිබුණු අතර ලේජර ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදු නොකර ව්‍යාපෘති වත්කම් ලෙස අඛණ්ඩ මූල්‍ය වාර්තා වල පෙන්නුම් කර තිබුණි.

(ආ) ජාතික ඉතිරි කිරීම් බැංකුවේ විශේෂ ණය පහසුකම් යටතේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු.මිලියන 7.64 ක අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 දිනට නොපිය වූ ශේෂයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම බරුකම් යටතේ පෙන්නුම් කර තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-------------------------------------------------

මාර්ග සංවර්ධන අධිකාරියෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩල සඳහා රු.588,224 ක දිරි දීමනා හා රු.962,749 ක් වූ පොදු කාර්ය පිරිවැය මහාභාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 ජේද වලට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සංවර්ධන ණය ගිවිසුම අනුව මූල්‍යනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අය වැය ඇස්තමේන්තු මගින් කරන ලද වෙන් කිරීම් | උපයෝජනය වූ අරමුදල | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුලදී | | **2015 දෙසැම්බර් 31 දක්වා** | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය | | | | | | | |
| ණය අංක 4138 සීඊ | 100.00 | 10,125 | - | | | 68.37 | 9,709 |
| ණය අංක 4429 සීඊ | 98.10 | 11,579 | - | | | 76.84 | 10,912 |
| ණය අංක 4906 සීඊ | 100.00 | 11,081 | 4,177 | 7.60 | 1,210 | 63.65 | 9,569 |
| ශ්‍රී ලංකා රජය | - | - | 241 | 1.70 | 241 | 49.00 | 7,012 |
| | 298.10 | 32,785 | 4,418 | 9.30 | 1,451 | 257.86 | 37,202 |

### 3.2 භෞතික ප්‍රගතිය

අතිරේක මූල්‍යණය යටතේ පුනරුත්ථාපනයවූ වැඩ කොටස් 4 ක පැලියගොඩ - පුත්තලම මාර්ගය කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගය හා පානදුර නගරයේ ගුවන් පාලම ඉදි කිරීම් වැඩ අපේක්ෂිත නිම කිරීමේ දිනට දින 56 සිට දින 359 කාල පරාසයක ප්‍රමාදයක් සහිතව 2015 ජුනි 30 දින නිම කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෑලියගොඩ - ජාඇල මාර්ග කොටසේ පුනරුත්ථාපන වැඩ හා සම්බන්ධ පැකේජ 3 හා 4 මත කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් ලියකියවිලි අනුව කොන්දේසි කිහිපයක් යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් පිළිවෙලින් රු.මිලියන 278.37 හා රු.මිලියන 250.10 වට්ටම් පිරිනමා තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා හා කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුලත් කොන්දේසි පිළිබඳ අවබෝධයක් නොමැති වීම නිසා පිළිවෙළින් රු.මිලියන 40.29 හා මිලියන 33.36 වට්ටම් පමණක් ව්‍යාපෘති කාලය අවසානයේදි අයිතිවාසිකම් ඉල්ලා සිටීමට හැකිව තිබුණි.

(ආ) ජාතික මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රමාණපත් පිළියෙල කිරීමේදී නාගරික ප්‍රදේශ වල භූගත පුනරුත්ථාපන වැඩ වල මැනුම් ඇතුළත් සියලුම කැපීපෙනන සාධකයන් සළකා බැලීමෙන් පසුව තාත්විකව පිළියෙළ කර නොමැති බව නිරීක්ෂණය විය. ප්‍රමාණ පත් වල ඇතුලත් කරන ලද සමහර අයිතම් ඉවත් කර තිබුණු අතර අලුත් අයිතම් හදුන්වා දී තිබීමේ ප්‍රතිඵලයක් ලෙස පුනරුත්ථාපන වැඩ වල ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.මිලියන 1,052 අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඇ) කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගය හා පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ කොටස් පුනරුත්ථාපන වැඩ ප්‍රමාද වී නිම කිරිම නිසා එකතු රු. මිලියන 485.4 ක ගාස්තුවක් පනවා තිබුණි. කෙසේ වුවද, මාර්ගයේ පුනරුත්ථාපන වැඩ ආරම්භ කිරීම ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්කරුගේ සම්පත් නිකරුනේ තිබීම, ලාභ අහිමිවීම හා ඒ හේතුවෙන් පොදු කාර්ය පිරිවැය දැරීමට සිදුවීම යන කරුණු පදනම් කොට ගෙන එකතු රු. මිලියන 942.5 ක පිරිවැය කාල දිගුවිමකට (Prolongation) අයිතිවාසිකම් ඉදිරිපත් කර තිබුණි. තවද උපදේශකවරුන්ගේ තක්සේරුවේ සඳහන් කර තිබුණේ කොන්ත්‍රාත්කරුගේ දුර්වලතාවයන් මත ප්‍රමාණවත් සම්පත් නොයෙදවීම, යන්ත්‍ර උපකරණ නිතර ක්‍රියාවිරහිත විම නිසා වැඩ ප්‍රමාදවී ඇති බවයි. කෙසේවුවද, ප්‍රමාද ගාස්තු කාලය දිගුවිමේ ගාස්තු වලට (Prolongation Cost) හිලව් කිරිමට තාක්ෂණ උපදේශක කමිටුව තීරණය කර තිබුණි.

(ඈ) මාර්ග පුනරුත්ථාපන වැඩ ප්‍රමාදව නිම කිරිමේ ප්‍රතිඵලයක් ලෙස උපදේශක කොන්ත්‍රාත් කාලයද මාස 14 කින් දීර්ඝ කිරීමටද, උපදේශක ගාස්තු එජඩො මිලියන 1.08 හා රු. මිලියන 251.99, එජඩො මිලියන 1.40 හා රු. මිලියන 412 දක්වාද වැඩි කොට තිබුණි.

## 3.4 පරිභාහිර කටයුතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් 02 කුට එක්සත් රාජධානියේ 2015 නොවැම්බර් මස දින 10 ක පුහුණු අවස්ථා සලසා දීම වෙනුවෙන් ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන රු. මිලියන 02 ක් වැය කර තිබුණි. 2015 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක ඇම්ඒ/01/2015/01 අනුව විදේශ ගමන් වලට අදාල අවශ්‍ය තොරතුරු මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු අතර ඒවා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, පුහුණුව ව්‍යාපෘති කටයුතු වලට ඍජු සම්බන්ධයක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) පුනරුත්ථාපනය කල මාර්ගවල විදුලි ගාස්තු හා විදුලි ලාම්පු නඩත්තු පිරිවැය හා පානදුර නගරයේ ගුවන් පාලමේ පියගැටපෙළ පහසුකම් වියදම් පියවීම සඳහා ක්‍රමවත් ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණි. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන වලින් පැලියගොඩ - පුත්තලම මාර්ගයේ පැලියගොඩ සිට ජාඇල දක්වා මාර්ග කොටසේ විදුලි ගාස්තු සඳහා ව්‍යාපෘතිය රු. මිලියන 3.46 ක් සමාලෝචිත වර්ෂයේ වැය කර ඇති බව නිරීක්ෂණය විය. තවද, පානදුර නගරයේ ගුවන් පාලමේ පියගැටපෙල පහසුකම් විදුලි ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ ජූනි හා ජූලි මාස වෙනුවෙන් රු.95,815ක් ව්‍යාපෘතිය මගින් නිරවුල් කර තිබුණි.

(ඇ) අදාල ජාතික මාර්ග පුනරුත්ථාපන වැඩ වලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් ලවා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලයට අවශ්‍ය රු.මිලියන 14.79 මෙහෙයුම් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒවායින් රු.මිලියන 7.70 ද්‍රව්‍ය විචලන නියෝග හරහා මිලදී ගෙන තිබුණි. තවද, ව්‍යාපෘතිය විසින් පී.වී.සී පයිප්ප තොග මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණු අතර ඒවා ප්‍රයෝජනයට නොගෙන මීගමුව මාර්ග සංවර්ධන අධිකාරියේ ගබඩා වල තිබුණි.

(ඈ) පුනරුත්ථාපන වැඩ අවසන් කිරීමෙන් පසු සාමාන්‍ය කටයුත්තක් ලෙස වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියට හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට මාරු කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය ජාතික මාර්ග කොටස් වල සිදු කරන ලද රු.මිලියන 284 ක ජල නල ඇතිරීමේ වැඩ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට මාරු කර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ කටයුතු වලට ඍජු සම්බන්ධයක් නැති විවිධ උත්සවයන් සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන වලින් රු. මිලියන 5.55ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

**3.5 අරමුදල් වියදම් කිරිම් වලට අදාල කරුණු**

පහත සදහන් කරුණු නිරික්ෂණය විය.

(අ) 2015 ජනවාරි 27 දින සිදු කල එජඩො මිලියන 47,329.56 සමාන රු.මිලියන 6.2 ආපසු ගැනුම් අයදුම්පතක් ප්‍රමාණවත් තොරතුරු හා ප්‍රභව ලියකියවිලි නොතිබීමෙන් ණය දෙන ආයතනය භාරගෙන නොතිබුණි.

(ආ) මුළු ණය ගිවිසුම් 3 යටතේ ව්‍යාපෘති කාලය අවසනායේදි විහැගි 8,956,010 ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර පසුව ණය දෙන ආයතනය ඒවා අවලංගු කර තිබුණි. මේ හේතුන් 2015 ඔක්තෝබර් 31 දිනට එජඩො මිලියන 2,303,146.93 සමාන රු.322,434,137 ක් ණය දෙන ආයතනයට ආපසු යවා තිබුණි.

**3.6 ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අදාල කරුණු**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කටයුතු 2015 ජුනි 30 දින නිමවු අතර 2015 සැප්තැම්බර් 30 ඉදිරිපත් කිරිමට එකඟ වී තිබු ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව 2015 දෙසැම්බර් 31 දිනට වත් ඉදිරිපත් කර නොතිබුණි. වාර්තා පිළියෙල කිරීම සදහා අතිරේක ප්‍රතිපාදන රු.මිලියන 2.57ක් සපයා තිබු බව නිරීක්ෂණය විය.

(ආ) 2015 ජුනි 30 ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබු නමුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට වත්කම් භාර දීමට හා ගිණුම් කටයුතු අවසන් කිරිමට ක්‍රියාකර නොතිබුණි.